**ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිය - 2018**

**-------------------------------------------------------------**

ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතියේ, 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 16 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සාර්ක් සංවර්ධන අරමුදල අතර 2014 දෙසැම්බර් 17 දින එළඹි ව්‍යාපෘති මූල්‍ය ගිවිසුමේ 3.3 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය.

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘති මූල්‍ය ගිවිසුම අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවල ජලය සහ පරිසර පද්ධති යටතේ යැපෙන ග්‍රාමීය ප්‍රජාවගේ ග්‍රාමීය ජන ජීවිතයේ ජීවන තත්ත්වය සහ චිරස්ථායී සංවර්ධනය වැඩි දියුණු කිරීම සහ මඩකලපුව හා මොනරාගල දිස්ත්‍රික්කවල ගම්මාන 09 අයත් ජල පෝෂක සහ වාරිමාර්ග පද්ධති යටතේ ජීවත්වන ප්‍රතිලාභී පවුල් 2800 ක ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො මිලියන 0.94 කට සමාන රු.මිලියන 119 ක් වූ අතර එය මූල්‍යනය කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදල එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 17 දින ආරම්භ කළ අතර 2017 දෙසැම්බර් 16 දිනට නිම කිරීමට අපේක්ෂිතය. කෙසේ වුවත්, 2018 දෙසැම්බර් 16 දින දක්වා ව්‍යාපෘතිය දීර්ඝ කර තිබුණු අතර නැවත දීර්ඝ කිරීමක් සිදුකර නොතිබුණි.

## 1.3 මතය.

**-------**

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 16 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **භෞතික කාර්යසාධනය.**

**-------------------------**

**2.1.** **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.**

**-----------------------------------------------**

ජල පෝෂක කළමනාකරණය ශක්තිමත් කිරීම, ඉඩම් භාවිතයන් සැලසුම් කිරීම, ජලය හා සනීපාරක්ෂාව හා ජලය ආශ්‍රිතව ඇතිවන රෝගයන් අවම කිරීම සඳහා ජනතාව දැනුවත් කර ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කෙරුණි. මේ සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරයි, තොප්පිගල සහ කලවන්චිකුඩි සහ මොණරාගල දිස්ත්‍රික්කයේ සෙල්ලකතරගම, කහකුරුල්ලන්පැලැස්ස, කිඹුල්කෙම සහ කඳසුරින්දුගම ගම්මානවල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර 2018 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කිරීමට අපේක්ෂා කෙරුණි. කෙසේ වුවත් මොණරාගල දිස්ත්‍රික්කයේ ඉදිපැලැස්ස වැව, ගිරිකටුව වැව සහ කුකුල් කටුව වැව්වල මෙම පුනරුත්ථාපන වැඩ කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කළත් 2019 සැප්තැම්බර් 10 දින වන තෙක් අවසන් කර නොතිබුණි.